# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1877/8 – 2014 අගෝස්තු මස 25 වැනි සඳුදා – 2014.08.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 210 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/2/2011/FR/272.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 2/3/3/2/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 14 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අඹන්ගඟකෝරළේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹන්ගඟ කෝරළේ සුලු කොට්ඨාසයේ, කරගස්තැන්න ගමේ පිහිටි මාතලේ කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2014.06.06 දින පිළියෙල කරන ලද අංක Ma/AMB/2014/77 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 9.2174 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

01. **කැබලි අක්ෂර 'ඒ' – කරගස්තැන්න – ප්‍රමාණය: හෙක්. 9.2174**
උතුරට: පාර; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කරගස්තැන්න වත්ත, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම.

09 – 238

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2014 අංක 211 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/99/FR/95.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 10/3/1/3/6.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38(අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට

1A – G 020113– 100 (2014/08)
*සැ.යු.– මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 21 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, රත්තොට.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ උඩසියපත්තුව සුළු කොට්ඨාසයේ, ගල්ගේවත්ත ඉහළ ගමේ පිහිටි මාතලේ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2001.07.19 දින පිළියෙල කරන ලද අවසාන මූලික පිඹුරු අංක මා 1348 දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 20.2381 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – ගල්ගේවත්ත – ප්‍රමාණය: හෙක්. 20.2381**
උතුරට: කේ. බී. ඒකනායක හිමිකම් කියන ගල්ගේවත්ත මු.පි.මා. 303 හා රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන කැලෑබොක්ක වත්ත; නැගෙනහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන කැලෑබොක්ක වත්ත හා රජය හිමිකම් කියන සෙම්බුවත්ත; දකුණට: රජය හිමිකම් කියන සෙම්බුවත්ත; බටහිරට: කේ. බී. ඒකනායක හිමිකම් කියන ගල්ගේවත්ත.

09 – 239

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2014 අංක 212 දරන ආඥාව

මගේ යොමු අංකය: 4-3/7/2013/එච්ඩබ්ලිව්/519.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ව/18/සීකේ/2013/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 14 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වත්තල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, තෙලඟපාත ගමේ පිහිටි අංක ගම්/වත්/2013/656 සහ 2014.07.23 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.0192ක් පමණ වූ කැබලි අක්ෂර ඒ, උළුවල කුඹුර නමැති ඉඩම් කැබැල්ලට මායිම්.

01. **කැබලි අක්ෂර ඒ – උළුවල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0192**
උතුරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි නම නොදන්නා ඉඩම සහ පාර; නැගෙනහිරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි නම නොදන්නා ඉඩම සහ එස්. ටී. රංජිත් හිමිකම් කියන උළුවල කුඹුර; දකුණට: එස්. ටී. රංජිත්, රුක්ශාන් සහ නලින් හිමිකම් කියන උළුවල කුඹුර; බටහිරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි නම නොදන්නා ඉඩම.

09 - 240

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 424/16 හා 1986.10.23 වැනි දන දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1986 අංක 471 හා 1986.10.20 දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් අංක ගම්/ඒ/81/64 සහ 1981.11.19 දිනැති ප්‍රගමණ අනුරේඛනයෙහි සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.016 ප්‍රමාණයේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 424/16 හා 1986.10.23 දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1986 අංක 471 හා 1986.10.20 දින දරන ආඥාවේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.016ක් පමණක් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන, අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/81/එල්ජී/229.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/6/12/581/කැල/110.
2014 අගෝස්තු මස 14 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහාරමුල්ල කැළණිය සුළු නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 7 සිංහාරමුල්ල පිලපිටිය ගමේ පිහිටි ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්/ඒ/81/64 හා 1981.11.19 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.016ක් වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 01 – වලව්වත්ත සහ මහවත්ත – ප්‍රමාණය: හෙක්. 1.016ක් ක් පමණ**
උතුරට: වේල්ල සහ කැළණිය රජමහා විහාරයට අයත් වලව්වත්ත; නැගෙනහිරට: කැළණිය රජමහා විහාරයට අයත් වලව්වත්ත සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ ඇම්. වී. පෙරේරා හිමිකම් කියන බෝලවත්ත; බටහිරට: ඇම්. වී. පෙරේරා හිමිකම් කියන බෝලවත්ත සහ වේල්ල.

09 - 241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.